# ලාංකේය ඉතිහාසයේ වීදිය බණ්ඩාරට හිමි තැන පිළිබඳව විමසීමක්

- වටරක්ගොඩ සුමන හිමි

## කාලීන තත්ත්වය

හයවන පරාක්‍රමබාහු රජුගේ විශිෂ්ට රාජ්‍ය පාලන නිපුණත්වය නිසා ගොඩනැගුණු කෝට්ටේ රාජ්‍ය එතුමාගේ අභාවයත් සමග අභාවයට යන ආකාරය හඳුනාගත හැකිය. එයට ප්‍රධාන හේතුව ලෙසින් අධ්‍යයනයන් තුළ තහවුරුව ඇත්තේ පරාක්‍රමබාහු රජුගෙන් පසුව රාජ්‍ය බාරය සඳහා රජුට දරුවන් නොසිටීමත් පත් වූ අනුප්‍රාප්තිකයන් පිළිබඳ විවිධ ගැටලු පැවතීමත් ය. 1412 දී පමණ ආරම්භය සනිටුහන් කරන කෝට්ටේ රාජධානිය 1521 දී සිදුවන විජයබා කොල්ලය නමැති ඓතිහාසික සිදුවීමත් සමග කොටස් වලට බෙදීයාම ආරම්භ වේ.[1] හයවන විජයබාහු රජුගේ (1513-1521) ඝාතනනේ පසු කෝට්ටේ පාලනය එතුමාගේ වැඩිමල් පුතු වන හත්වන බුවනෙකබාහු කුමරු (1521-1551) යටතේ ද රයිගම ප්‍රදේශය පරරාජසිංහ කුමරු යටතේ ද සීතාවක ප්‍රදේශය මායාදුන්නේ කුමරු (1521-1581) යටතේ ද පාලනය කිරීම සිදුවේ. රයිගම පාලනය කරමින් සිටි පරරාජසිංහ කුමරා ටික දිනකින් මියගිය නිසා එම ප්‍රදේශයේ ද පාලන අයිතිය මායාදුන්නේ කුමරා විසින් ලබාගන්නා ලදී. ඒ අනුව මේවන විට ලංකාවේ කෝට්ටේ හා සීතාවක වශයෙන් ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථාන දෙකක් වූ අතර කන්ද උඩරට ප්‍රදේශය වික්‍රමබාහු නම් ප්‍රාදේශීය පාලකයෙකු යටතේ පාලනය විය. මේ අතර තුර රාජ්‍යත්වය ලබාගැනීමේ අපේක්ෂාවෙන් පසු වූ මායාදුන්නේ කුමාරයාගේ ආක්‍රමණකාරී තර්ජන නිසා ඒවන විට ලංකාවට පැමිණ සිටි පෘතුගීසීන්ගේ සහය ලබාගනිමින් තම බල ප්‍රදේශය රැකගැනීමට



හත්වන බුවනෙකබාහු රජුට සිදුවිය. වීදිය බණ්ඩාර නම් චරිතය ඉතිහාසය තුළ හමුවන කාල පරාසයේ ලංකාවේ පැවතියේ මෙබඳු දේශපාලනමය වටපිටාවකි.

## වීදිය බණ්ඩාරගේ ඉතිහාසය

ඓතිහාසික සටහන් පිරික්සීමේදී පෙනී යන්නේ වීදිය බණ්ඩාර හැඳින්වීම සඳහා 'වේධය' යන නාමය ද භාවිත කොට ඇති බවයි. රාජාවලිය හා අලකේශ්වර යුද්ධය දක්වන ආකාරයට මව්පසින් කෝට්ටේ රාජ පරම්පරවට ඥාතිත්වයක් දැක්වූ මෙතුමාගේ මව, මාදම්පේ ප්‍රදේශය පාලනය කළ අටවන වීර පරාක්‍රමබාහු රජුගේ පුත්‍රයකු වූ තනියවල්ලභ කුමරාගේ දියණියයි. ඈ නමින් කපුරු ළමා එතනී ය. පියා සොළී සම්භවයක් සහිත කුමාර බණ්ඩාර නමැති අධිපතියෙකි.[2] ක්වේරෝස් නැමැති පෘතුගීසි ගත් කතුවරයා සඳහන් කරන ආකාරයට වීදිය බණ්ඩාරගේ මව්පියන් වන්නේ හයවැනි විජයබාහු රජුගේ සහෝදරියක් වූ කපුරු ළමා එතනියගේ දියණියක් හා කොමෙරි ද බණ්ඩාර නම් කුමාරයෙකි.[3] වැලන්ටයින් නම් පෘතුගීසි ලේඛකයා, වීදිය බණ්ඩාරගේ පියා යාපනය ප්‍රදේශයේ රජෙකු බව පෙන්වා දෙයි.[4] මෙම තොරතුරුවල පවතින විවිධත්වය හේතුවෙන් මොහුගේ සැබෑ මව්පියන් කවුරුන්දැයි තහවුරු කරගැනීමේ අපහසුතාවක් පැනනගී. අලකේශ්වර යුද්ධය කෘතියේ දැක්වෙන්නේ වීදිය බණ්ඩාර, තනියවල්ලන් නමැති විරුද නාමයක් භාවිත කොට ඇති බවයි. එම නාමය වීදිය බණ්ඩාරගේ මව්පසින් සීයා වූ තනියවල්ලභ නාමයට සමානතාවයක් දක්වන බැවින් රාජාවලියේ මොහුගේ මාපියන් පිළිබඳ දක්වන තොරතුරු පිළිගත හැකි බව පෙනේ.

වීදිය බණ්ඩාරට තම්මිට බණ්ඩාර නමින් සහෝදරයෙක් ද විය. ළමා කාලය වීදිය බණ්ඩාර කෙබඳු ලෙස ගතකළේදැයි තහවුරු කරගැන්මට තොරතුරු නැතත් මොහු කවරාකාරයේ පුද්ගලයෙක්දැයි ක්වේරෝස්ගේ ලේඛන තුළින් හඳුනාගත හැකිය. එහි දැක්වෙන ආකාරයට වීදිය බණ්ඩාර යනු උස ශරීරයක් ඇති කලු පැහැයට හුරු ශරීර වර්ණයකින් යුත් කෙනෙකුට බියගෙන

දෙන දෙනෙත් සහිත පුද්ගලයෙකි.[5] මොහු කුඩාකල පටන් අවි ශිල්පයෙහි දක්ෂ නිර්භීත පුද්ගලයෙකු වූ බව පසුකාලීන ක්‍රියාකාරකම් තුළ මනාව හඳුනාගත හැකිය. සීතාවක රාජ්‍යයෙන් එල්ල වන තර්ජන දරාගැනීමට අපොහොසත්ව සිටි හත්වන බුවනෙකබාහු රජු, වීදිය බණ්ඩාර තම ප්‍රධාන සෙන්පතියා බවට පත්කරගත්තේ ද එකී හැකියාවන් නිසා වන්නට ඇත. මෙම තෝරාගැනීම විසින් කෝට්ටේ රාජ්‍යයේ ඉතිහාසය නව මානයක් වෙත රැගෙන යෑමට සමත් වූ බව හඳුනාගත හැකිය.

හත්වන බුවනෙකබාහු රජුට පුතුන් නොසිටි බැවින් තම එකම දියණිය වූ සමුද්‍ර දේවිය බල සම්පන්න කුමාරයෙකුට විවාහ කර දී ඒ හරහා ස්වකීය රාජ්‍යයේ ස්ථායීතාවය රැකගැන්මට ප්‍රයත්න දැරීය. ඒ සඳහා රජුගේ යෝජනාව වූයේ රජු ඇසුරේ හැදුණු වැඩුණු ජුගෝ බණ්ඩාර හෙවත් ජයෝ බණ්ඩාර නම් කුමාරයෙකුට ඇය විවාහ කොට දීමටයි. එහෙත් සමුද්‍ර දේවිය ඒවන විට වීදිය බණ්ඩාර හා ප්‍රේම සම්බන්ධතාවක් ගොඩනගාගෙන සිටියේය. මේ අතරතුර බුවනෙකබාහු රජු ස්වකීය යෝජනාවට අනුව විවාහ කටයුතු සූදානම් කළේය. මේ බව දැනගත් වීදිය බණ්ඩාර, ජයෝ බණ්ඩාර සොයා ගොස් ද්වන්ධ සටනක් කොට ඔහු මරා දැම්මේය. කුඩාකල පටන් තම සෙවණේ හැදී වැඩුණු තම බෑණා බවට පත්කර ගැනීමට සිටි ජයෝ බණ්ඩාර ඝාතනය කිරීම නිසා බුවනෙකබාහු රජුගේ උදහසට ලක් වූ වීදිය බණ්ඩාරට සැඟවී සිටින්නට සිදුවිය. නමුත් සීතාවක රාජ්‍යයෙන් හා කන්ද උඩරටින් කෝට්ටේ රාජ්‍යයට එල්ල වූ ආක්‍රමණ නිසා වීදිය බණ්ඩාර වැනි දක්ෂ සෙන්පතියෙකුගේ අඩුව බුවනෙකබාහු රජුට දැඩිව දැනුනේය. ක්වේරෝස් දක්වන ආකාරයට මේ තත්ත්වය මත කෝට්ටේ රාජ්‍යය රැකගැන්මට වීදිය බණ්ඩාර වැනි දක්ෂ රණශූරයෙකුගේ අවශ්‍යතාව අවබෝධ කොටගෙන සිටි බුද්ධවංශ සංඝරාජ හිමියෝ තම මැදිහත් වීමෙන් රජුගේ උදහස සංසිඳුවා වීදිය බණ්ඩාර යළි රාජ්‍ය සේවයේ පිහිටවූහ.



මෙම සිදුවීම් වලින් පසුව වීදිය බණ්ඩාර 1538 දී පමණ සමුද්‍ර දේවිය හා විවාහ වේ.[6] එම විවාහයෙන් වීදිය බණ්ඩාරට දාව කෝට්ටේ මීළඟ අනුප්‍රාප්තිකයා වන ධර්මපාල කුමරු උපත ලැබීය.[7] මේ අතරතුර වීදිය බණ්ඩාර සටනක් මෙහෙයවීම සඳහා කෝට්ටේ රාජ්‍යයෙන් පිටව ගොස් සිටි කාලයක් අතරතුර දියෝගෝද අරව්ජෝ නමැති පෘතුගීසි ජාතිකයා සමඟ සමුද්‍ර දේවිය ගොඩනගාගත් අනියම් සබඳතාවක් හෙළිවීම නිසා ඇය වීදිය බණ්ඩාර විසින් දියේ ගිල්වා මරා දමනු ලබයි.[8] මෙම සිදුවීම පිළිබඳව අධ්‍යයනය කොට ඇති මහාචාර්ය පද්මසිරි කන්නංගර මහතා කලුතර දිසාවරුණ ලිපි සංග්‍රහයට 'වීදිය බණ්ඩාරගේ පැළෑඳ බලකොටුව හා පස්දුන් කෝරළය' යන මැයෙන් ලිපියක් සපයමින් එබඳු ආකාරයට වීදිය බණ්ඩාර විසින් සමුද්‍ර දේවිය ඝාතනය නොකළ බවත් එය පෘතුගීසීන්ගේ ප්‍රබන්ධයක් බවත් පෙන්වා දෙයි.[9] එතුමා පවසන්නේ රාජාවලියේ[10] සහ අලකේශ්වර යුද්ධයේ[11] දැක්වෙන ආකාරයට ඇය යක්ෂ අවගතියකින් මිය යන්නට ඇති බවයි. යක්ෂ අවගතිය යන්නෙන් මානසික අවපීඩන තත්ත්වය නිසා සියදිවි නසා ගැනීම, හෘදයාබාධයකට ලක්වීම හෝ හදිසි අනතුරකින් මිය යාම අර්ථ ගැන්වෙන බව ද පද්මසිරි මහතා පෙන්වා දෙයි. රිස්මන් අමරසිංහ මහතාගේ පර්යේෂණයට අනුව සමුද්‍ර දේවිය මියගොස් ඇත්තේ පැළෑඳ ප්‍රදේශයේ සිටියදී 1554 දී පමණ වන නිසා[12] කෝට්ටේ ප්‍රදේශයේදී ඇය දියේ ගිල්වා මරණ ලදැයි යන කථාව පිළිගත නොහැක්කක් බවට පත්ව තිබේ.

කෙසේ වෙතත් වීදිය බණ්ඩාර සමුද්‍ර දේවියට අමතරව තවත් කාන්තාවක් විවාහ කරගෙන සිටි බව දේශීය සහ විදේශීය මූලාශ්‍ර පාර්ශ්ව දෙක විසින්ම සනාථ කොට තිබේ. රාජාවලියේ දැක්වන්නේ ''නැවත සන්තානයට මායාදුන්නේ රජ්ජුරුවන්ගේ කුඩාටිකිරි අදහසින් වීදියේ රජ්ජුරුවන්ඩ දෝලියට ගෙනත් සන්තාන විය''[13] යනුවෙනි. ඒ අනුව ඇය සීතාවක පාලනය කළ මායාදුන්නේ රජුගේ දියණියක වන මහබිසෝ බණ්ඩාර හෙවත් සූරිය දේවිය බව හඳුනාගත හැකිය.[14] මෙම විවාහයෙන් වීදිය බණ්ඩාරට ලැබුණු දරුවා විජේපාල නමින් හඳුන්වා තිබේ.[15] මොහු තම පියා වූ වීදිය බණ්ඩාර අවසන් ගමන් යන මොහොත

දක්වාම ඔහු සමීපයේ රැඳී සිටි බවට මූලාශ්‍ර තහවුරුකොට ඇත.[16] සීතාවක සමග සිදුකළ සටනකදී පරාජයට පත් විදිය බණ්ඩාර මායාදුන්නේ රජුගේ සිරකරුවෙක් බවට පත්විය. ඒ සිටින අතරතුර ඇති කරගත් සබඳතාවය මත මෙම දෙවන විවාහය සිදුව තිබේ.

## දේශපාලන ක්‍රියාවලිය තුළ විදිය බණ්ඩාර භූමිකාව

ස්වකීය කුසලතාව පදනම් කරගෙන හත්වැනි බුවනෙකබාහු රජුගේ අවධානය දිනාගනිමින් කෝට්ටේ රාජ්‍යයේ ප්‍රධාන සෙන්පතියා බවට පත්ව සිටි විදිය බණ්ඩාරගේ වගකීම වී තිබුණේ කන්ද උඩරට රාජ්‍යයෙන් හා සීතාවක රාජ්‍යයෙන් එල්ලවන අභියෝගයන්ගෙන් තම රාජ්‍යය ආරක්ෂාකිරීමයි. කෝට්ටේ රාජ්‍යයට ප්‍රබල වශයෙන් අභියෝග එල්ල වූයේ සංග්‍රාමයෙහි නිපුණයෙකු වූ මායාදුන්නේ විසින් පාලනය කළ සීතාවක වෙතිනි. කෝට්ටේ සෙන්පතියා වශයෙන් විදිය බණ්ඩාර ස්වකීය පළමු රාජතාන්ත්‍රික යුද්ධමය ක්‍රියාමාර්ගය අනුගමය කරන්නේ සීතාවකට එරෙහිවය. එහිදී විදිය බණ්ඩාරගේ ජීවිතයේ අවසාන කාලය දක්වාම සමීපයේ රැඳී සිටිමින් සෑම සංග්‍රාම කාර්යයකටම පාහේ උරදුන් බත්ගෙයි රාළහාමි[17] සහ වේලායුධ ආරච්චි[18] යන සහචරයන් දෙදෙනාගේ ද සහයෝගයෙන් තම ප්‍රථම යුධ ජයග්‍රහණය ලබාගැන්මට සමත්විය.

ඉන්පසුව කන්ද උඩරට ප්‍රදේශය ප්‍රදේශයට ආක්‍රමණයක් මෙහෙය වූ විදිය බණ්ඩාර, උඩරට පාලනය කරමින් සිටි වික්‍රමබාහු සහ ඔහුගේ පුත්‍රයා ද පරාජයට පත්කළේය. සතුරන්ට විරුද්ධව ඉතා සාහසික ආකාරයෙන් පහරදුන් විදිය බණ්ඩාර කන්ද උඩරට ජයගත් පසු එහිම රැඳෙමින් තමන්ට විපක්ෂ ජනයාකෙරෙහි විවිධාකාරයේ දඬුවම් පමුණුවන්නට විය. මේ බව බුවනෙකබාහු රජුට ආරංචි වීමෙන් පසු එම කටයුතු නවත්වා වහා යළි පැමිණෙන ලෙස දන්වා රජුගේ ප්‍රධාන අමාත්‍යවරයෙකු වූ එතකෝන් රාළහාමි පිටත් කොට යැවීය. එහෙත් රජුගේ නියෝජිතයාත් විදිය බණ්ඩාරත් අතර ඇතිවූ ද්වන්ධ සටනකින්



ඇමතිවරයා මරුමුවට පත්විය. ඉන් පසු රජු, විදිය බණ්ඩාර රාජද්‍රෝහියෙක් ලෙස නම් කොට සේනාපතිකමෙන් ද නෙරපා එම තනතුර බෝඹුවේ රාළට පැවරීය. මේ බව දැනගත් විදිය බණ්ඩාර වහා රජමාළිගයට පැමිණ රජුගෙන් සමාව භජනය කොට සේනාපති තනතුර නැවත ලබාගත්තේය.

මෙම කාලවකවානුවේ ඌව ප්‍රදේශයේ ප්‍රාදේශීය වශයෙන් ඇති වූ ගැටුමක් විසඳීම සඳහා රජු විසින් බෝඹුවේ රාළ නම් ඇමතියා පිටත්කොට යැවීය. එහි ගොස් ගැටළුව විසඳූ ඇමතියා එම ප්‍රදේශයේ බලය තහවුරු කරගනිමින් කෝට්ටේ රජුට එරෙහිව යුධ ප්‍රකාශ කළේය. එම අභියෝගයට මුහුණදීම සඳහා රාජ නියෝගයට අනුව විදිය බණ්ඩාර ඌව බලා ගියේය. කෝට්ටේ රාජ්‍යයෙන් පලිගැනීම සඳහා අවස්ථාවක් සොයමින් සිටි සතුරු පාර්ශ්වයන්ට මෙය කදිම අවස්ථාවක් විය. ඒ අනුව කන්ද උඩරට වික්‍රමබාහුත් සීතාවක මායාදුන්නේත් සන්ධානගතව පහරදීම සඳහා සූදානම් වූහ. මේ බව දැනගත් විදිය බණ්ඩාර ඌවේ සටන අත්හිටුවා කෝට්ටේ ආරක්ෂා කිරීම සඳහා පැමිණියේය. වික්‍රමබාහුගේ සේනාව, සීතාවක සේනාව හමුවීමට ප්‍රථම එම සේනාවට පහරදී විනාශ කළ විදිය බණ්ඩාර සීතාවකට පහර දීමට ගියේය. විදිය බණ්ඩාරගේ සංග්‍රාම ශූරත්වයට මුහුණදීමට නොහැකි බව අවබෝධ කොටගත් මායාදුන්නේ රජු උපක්‍රමශීලීව පසුබැස සීතාවකට පැමිණි විදිය බණ්ඩාර යටත් කරගැනීමට සමත්විය. මෙය විදිය බණ්ඩාරගේ පළමු පරාජයයි. එහෙත් මායාදුන්නේ රජුගේ දියණිය වූ සූරිය දේවිය හා ප්‍රේම සබඳතාවක් ගොඩනගාගෙන සිරගෙයින් පලායාමට සමත් වේ. පසුකාලීනව තම දෙවැනි බිරිඳ බවට පත්කරගන්නේ මෙම සූරිය දේවියයි.

උඩරට සහ සීතාවක යළිත් එකතුව 1546 දී කෝට්ටේ රාජධානියට පහරදීමට කටයුතු සකසන බව දැනගත් විදිය බණ්ඩාර ඊට ප්‍රථම උඩරට ආක්‍රමණය කළේය. කෙසේ හෝ කෝට්ටේ පරාජය කිරීමේ අපේක්ෂාවෙන් පසු වූ මායාදුන්නේ ඒ සඳහා එම කාල වකවානුව වනවිට බලවත්ව සිටි යාපනයේ චාග රජුගේ උදව් ඉල්ලීය. ඒ අනුව 1549 දී ද්‍රවිඩ සේනාව සහ

සීතාවක සේනාව එකතුව කෝට්ටේ වෙත ආක්‍රමණයක් දියත් කළේය.[19] එම ආක්‍රමණය සාර්ථකව මැඩපැවැත් වූ විදීය බණ්ඩාර කෝට්ටේ ආරක්ෂාව සුරක්ෂිත කිරීමට සමත් විය. මෙම සටනින් ටික කලකට පසු කන්ද උඩරට ආක්‍රමණය කළ සීතාවක රාජ්‍යය මායාදුන්නේගේ පුත් රාජසිංහ රජුගේ නායකත්වයෙන් ප්‍රබල තත්ත්වයකට පත්විය. රාජසිංහ, කෝට්ටේ ආක්‍රමණය කිරීමට පළමුව සීතවක ආක්‍රමණය කළයුතු බව තීරණය කළ වීදිය බණඩාර 40000 ක පමණ සේනාවකින් සමන්විතව යුද්ධයක් මෙහෙයවීය. නමුත් එම සටනින් පරාජයට පත්වීමට වීදිය බණ්ඩාරට සිදුවිය.

මෙම කාලසමයේ කෝට්ටේ හත්වන බුවකෙබාහු රජු පෘතුගිසීන් සමග සමීප සබඳතා පැවැත්වූ නිසා ජනතාව බොහොමයක් සීතාවක රාජ්‍යයට පක්ෂව කටයුතු කළහ. රාජසිංහ රජුගේ නායකත්වයෙන් සවිමත්ව සිටි සීතාවක 1548 දී කෝට්ටේ රාජ්‍යය ආක්‍රමණය කළත් වීදිය බණ්ඩාරගේ සේනා හමුවේ පරාජයට පත්වීමට සිදුවිය. 1550 දී පමණ කෝට්ටේ රාජසභාවට පැමිණි පෘතුගීසි සෙන්පතියෙකු වූ අල්පොන්සෝද නොරොඤ්ඤෝ විසින් බුවනෙකබාහු රජුට අවමන් කිරීම නිසා කොළොම්තොට වාසී සිංහල හා මුස්ලිම් පිරිස් එකතුව පෘතුගීසින්ට විරුද්ධව කැරැල්ලක් දියත් කළහ. මෙම කැරැල්ල පාලනය කිරීම සඳහා කටයුතු කළේ වීදිය බණ්ඩාර වීම විශේෂ කාරණයක් ලෙස සැලකිය හැකිය. මෙයින් පෙනෙන්නේ මුල්කාලීනව පෘතුගීසීන් සමඟ විරසකයක් වීදිය බණ්ඩාරට නොතිබූ බවයි. එහෙත් මෙම තත්ත්වය කාලානුරූපීව වෙනස් වන ආකාරය හඳුනාගත හැකිය. ඒ සඳහා බලපෑ ප්‍රධානම හේතුව වූයේ කෝට්ටේ රජකම වීදිය බණ්ඩාරගේ පුතෙකු වූ ධර්මපාලට බාර දී විවේකීව කැළණිය ප්‍රදේශයේ වාසය කළ බුවනෙකබාහු රජු 1551 දී පෘතුගීසීන් විසින් යොදවන ලද හේවායෙකු විසින් වෙඩිතබා ඝාතනය කිරිමයි.[20]

ලංකාවේ රාජ්‍ය කටයුතු සඳහා පළමුවරට යුරෝපා ජාතියකගේ සහය සෘජුවම ලබාගත් හත්වන බුවනෙකබාහු රජු පෘතුගීසීන් අතින්ම ඝාතනය වීමෙන් පසුව කෝට්ටේ සියලුම



කටයුතු පාහේ ක්‍රියාත්මක වී ඇත්තේ පෘතුගීසීන්ට අවශ්‍ය ආකාරයටය. එයට හේතුව බුවනෙකබාහු රජු ජීවත්ව සිටියදීම ධර්මපාල කුමරු පෘතුගිසීන්ට පවරා දී පෘතුගාලයේ රජු යටතේ බෞතිස්ම කොට තිබීමයි. ධර්මපාල කුමරු පාලන කටයුතු සිදුකළේ රූකඩ පාලකයෙක් ලෙසය. එසේ වුවත් සිංහල බෞද්ධ බලවේගය නියෝජනය කරමින් කෝට්ටේ රාජ්‍යයේ ආරක්ෂකයා ලෙස වීදය බණ්ඩාර පෙනී සිටියේය. එපමණක්ම නොවේ ඔහු ස්වාධීනව තීරණ ගනිමින් පාලකයෙකු වශයෙන් කටයුතු සිදුකිරිම ආරම්භ කළේද මෙම සිදුවීම් වලින් පසුවය.

මේ අතරතුර 1551 සැප්තැම්බර් මාසයේ දී තුන්දහස් පන්සීයක සේනාවක් සමග ලංකාවට පැමිණි අල්පොන්සෝද නොරොඤ්ඤෝ කෝට්ටේ රාජ්‍යය කොල්ලකා සීතාවක රාජ්‍යය ද ආක්‍රමණය කළේය.[21] මෙම ආක්‍රමණයන්ගෙන් පෘතුගීසීන් බලාපොරොත්තු වූයේ තම යුධ ශක්තිය පෙන්වීමයි. මෙම ආක්‍රමණයන්ට මුහුණ දීමට නොහැකි වූ වීදිය බණ්ඩාර කෝට්ටේ රාජධානිය අතහැර ගොස් අප්‍රකටව කාලයක් වාසය කළේය. ඉන් පසුව ටික කලකින් සේනා සංවිධානය කරගත් වීදිය බණ්ඩාර තම රාජධානිය වූ කෝට්ටේ රාජධානියට ඇතුළුව පෘතුගීසීන් පලවාහැර ක්‍රිස්තියානීන් මර්දනය කොට ඔවුන්ගේ බලය කොළඹ කොටුවට පමණක් සීමා කිරීමට සමත් විය.[22] ප්‍රථම වතාවට වීදිය බණ්ඩාර පෘතුගීසීන්ට විරුද්ධව සෘජුවම නැගී සිටියේ මෙම අවස්ථාවේය. ලංකාවෙන් පෘතුගීසීන් පලවා හැරීම තරම් ප්‍රබල වූ මෙම පහරදීම මිගෙල්ද කුටිඤ්ඤෝ නැමැති පෘතුගීසි නියෝජිතයාගේ දූත ගමන නිසා අඩාල වූ බව හඳුනාගත හැකිය.

කෙසේ වෙතත් මෙම සිදුවීමෙන් පසුව කොළඹ කොටුව බාර නියෝජිතයා ලෙස පත්ව ආ ඩුවාර්ට් ඩී එකා, වීදිය බණ්ඩාරගේ බොහෝ බාධා කිරිම් හමුවේ කොටුව ශක්තිමත් කිරීමේ කටයුතු සිදු කළේය. තම මාමා වූ බුවනෙකබාහු රජු ඝාතනය කිරීමත් බෞද්ධ සිද්ධස්ථාන වනසමින් ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය කිරීමත් නිසා පෘතුගීසීන් පිළිබඳව පැවති වීදිය බණ්ඩාරගේ වෛරය පෘතුගීසීන්ට නිදහසේ වැඩකටයුතු සිදුකරගෙන යාමට කිසිලෙසකින්වත් ඉඩලබා නොදුන්නේය. මේ

නිසා පෘතුගීසීන්ගේ පරම හතුරෙක් බවට වීදිය බණ්ඩාර පත්විය. ඩිවාර්ට් ඩී එකා සෙන්පතියාගේ ඉල්ලීම පරිදි වීදිය බණ්ඩාර අත් අඩංගුවට ගැනීම සඳහා ඩියෝගෝද මේලෝ කුටිඤ්ඤෝ නම් යුධ සෙනවියා විශාල සේනාවක් සමඟ ලංකාවට පැමිණියේය. ඔවුන් එසේ විශාල සේනාවක් සහිතව පැමිණිය ද කෝට්ටේ රැඳී සිටි වීදිය බණ්ඩාර අත්අඩංගුවට ගෙන ඇත්තේ කූට උපායක් භාවිත කරමිනි. ඩියෝගෝද මේලෝ පෘතුගීසි සෙබළුන් දහතුන්දෙනෙකු සමඟ සාකච්ඡා කරන මුවාවෙන් වීදිය බණ්ඩාරගේ මාලිගයට ඇතුළු වී නිරායුධව සිටි ඔහු අත්අඩංගුවට ගත්තේය.

අත්අඩංගුවට ගැනීමෙන් පසුව වීදිය බණ්ඩාර මෙරටින් පිටුවහල් කිරීමට තීරණය කළ පෘතුගීසීන් ඒවනවිට ආරම්භව තිබූ මෝසම් සුළං නිමවන තුරු ඔහු කොළඹ කොටුවේ අඳුරු සිරමැදිරියක රඳවා තැබීය.[23] ශ්‍රී ලාංකේය වාර්තාගත ඉතිහාසය තුළ සිදු වූ විශිෂ්ටතම ගලවාගැනීමේ මෙහෙයුම සිදුවන්නේ මෙම සිරගත කිරීම සමඟිනි. මෙම සිදුවීම පිළිබඳව රාජාවලිය,[24] අලකේශ්වර යුද්ධය[25] සහ දියගෝද කූටෝ,[26] ක්වේරෝස්[27] යන පෘතුගීසි ලේඛකයන්ගේ කෘති තුළ පැහැදිලිව දක්වා තිබේ. එම ග්‍රන්ථවල එන තොරතුරුවලට අනුව වීදිය බණ්ඩාරගේ බිසවක විසින් පල්ලරුන් නමැති උමං මාර්ග තැනවීම සම්බන්ධ විශේෂ පිරිසක් යොදවා කෝට්ටේ සිට කොළඹ කොටුවේ වීදිය බණ්ඩාර රැඳී සිටි සිරගෙය දක්වා උමගක් කප්පවා වීදිය බණ්ඩාර පෘතුගීසීන්ගෙන් ගලවාගෙන තිබේ. මෙම මෙහෙයුම සිදුව තිබෙන්නේ 1553 දී පමණය.[28] කිසිදු ලේ සෙලවීමක් නොකර අත්අඩංගුවට ගත් වීදිය බණ්ඩාර කිසිදු ලේ සෙලවීමකින් තොරව බේරාගැනීම, කායික බලය වෙනුවට උපක්‍රමික බලයේ ප්‍රබලත්වය පෙන්වූ ඓතිහාසික සිදුවීමකි.

සිරෙන් මිදුණු වීදිය බණ්ඩාර අටලුගමට පැමිණියේය. එහි ටික කාලයක් වාසය කරමින් තමන්ගේ ආරක්ෂාවට සුදුසු ස්ථානයක් සෙවීය. කෝට්ටේ ප්‍රදේශය ඇතුළු මුහුදුබඩ කලාපය පෘතුගීසීන් යටතේ පැවතීමත් රයිගම සහ සීතාවක ප්‍රදේශ මායාදුන්නේ යටතේ පැවතීමත් නිසා ස්වාධීනව තම බලය



පැතිරවිය හැකි ප්‍රදේශයක අවශ්‍යතාවය තිබුණේය. ඒ සඳහා වීදිය බණ්ඩාරගේ සොයාගැනීම වුයේ වත්මන් කළුතර දිස්ත්‍රිකයට අයත් මතුගම ප්‍රදේශය අසළ පැළෑද ගමයි. ජල දුර්ගවලින් හා කඳු පංතිවලින් සමන්විත මෙම ප්‍රදේශය ස්වාභාවිකවම ආරක්ෂක ස්ථානයක් බව අද පවා නිරීක්ෂණය කිරීමෙන් හඳුනාගත හැකිය. මෙම ප්‍රදේශයේ උස් බිමක තම බලකොටුව ඉදිකරගත් වීදිය බණ්ඩාර තම සතුරන් වූ පෘතුගීසීන් සහ සීතාවකට එරෙහිව යුධමය ක්‍රියාමාර්ග ආරම්භ කළේය.

ඒ අනුව පළමුවෙන්ම විශාල සේනාවක් සහිතව පෘතුගීසි බලය පැවති පානදුර සිට වැලිගම දක්වා වූ මුහුදුබඩ කලාපයට ස්වකීය ආක්‍රමණය දියත් කළ වීදිය බණ්ඩාර එම ප්‍රදේශයන්හි පැවති පෘතුගීසි බලය මුලිනුපුටා දමමින් දරුණු ප්‍රහාරයක් දියත් කළේය. එහිදී එම ප්‍රදේශයන්හි වූ සියලු ක්‍රිස්තියානි දේවස්ථාන විනාශ කොට ගාලු වරායේ නවතා තිබූ පෘතුගීසි නැවක් ද ගිනිබත් කර වනසා දැමුවේය. මින් පසුව වීදිය බණ්ඩාර කෝට්ටේ සිටි තමාට පක්ෂපාතී පිරිස් සම්බන්ධ කරගනිමින් කැරැල්ලක් ආරම්භ කළේය. එහෙත් කැරැල්ලට සම්බන්ධ වූ කෝට්ටේ සිටි නායකයන් පෘතුගීසීන් විසින් අත්අඩංගුවට ගෙන මරාදැමීම නිසා එම සටන අසාර්ථක වූයෙන් වීදිය බණ්ඩාර යළි පැළෑද බලා පැමිණියේය.

මෙම කාලයේ පෘතුගීසීන් සතු වූ බලය පිළිබඳව විමසන විට පෙනී යන්නේ වීදිය බණ්ඩාර සහ සීතාවක මායාදුන්නේ එකතුව පෘතුගිසීන්ට පහර දුන්නේනම් පැහැදිලිවම පෘතුගීසි බලය ලංකාවෙන් තුරන් කිරීමේ හැකියාව තිබුණු බවයි. එහෙත් සීතාවක රාජ්‍යය පෘතුගීසි විරෝධී පිළිවෙතක් වෙනුවට වීදිය බණ්ඩාර විරෝධී පිළිවෙතක් අනුගමනය කිරීම නිසා එම අවස්ථාව අහිමි වී ගොස් තිබේ. මෙම තත්ත්වය තුළ පෘතුගීසීනුත් සීතාවකත් තමන්ට පොදු සතුරා වූ වීදිය බණ්ඩාරට විරුද්ධව එකගතාවකට පැමිණ පැළෑඳ රාජධානිය ආක්‍රමණය කිරීමට තීරණය කර තිබේ. මෙම එකඟතාව සිදු වී ඇත්තේ 1555 අගෝස්තු මාසයේ බව ක්වේරෝස්ගේ වාර්තාවලින් හෙළිවේ.[29] 14000 ක පමණ පිරිස් බලයකින් යුතු වූ වීදිය බණ්ඩාරට 30000

ක පමණ පිරිස් බලයකින් සමන්විත පෘතුගීසි-සීතාවක ඒකාබද්ධ හමුදාවට මුහුණදීමට සිදුවිය. ඉතා දරුණු සටනකින් පසු පරාජයට පත්වූ වීදිය බණ්ඩාර වළලවේ ප්‍රදේශය හරහා සත් කෝරළයට පසුබැස්ස බව රාජාවලිය සඳහන් කරයි.

තමා විසින්ම ගොඩනගන ලද රාජධානිය අහිමි වීමෙන් පසුව වීදිය බණ්ඩාර කන්ද උඩරට රාජධානිය වෙත ගොස් තිබේ. එහි පාලකයාව සිටි කරලියද්දේ බණ්ඩාරගේ විශ්වාසය දිනාගන්නා වීදිය බණ්ඩාර තම අභිලාසයන් විනාශ කළ සීතාවකින් පළිගැනිම සඳහා පිඹුරුපත් සැකසීය. සීතාවකට ප්‍රහාරයක් එල්ලකිරීම සඳහා මෙය කදිම අවස්ථාවක් බව වටහාගත් කරලියද්දේ බණ්ඩාර, වීදිය බණ්ඩාරට පූර්ණ සහයෝගය ලබා දුන්නේය. එම සහයෝගය මත සීතාවකට එරෙහිව ආක්‍රමණයක් දියත් කළත් එය ජයගැන්මට අසමත් විය. මෙම ආක්‍රමණය නිසා කුපිත වූ සීතාවක රාජසිංහ, වීදිය බණ්ඩාර කන්ද උඩරටින් පිටුවහල් නොකරන්නේනම් උඩරට ආක්‍රමණය කරන බවට තර්ජනය කළේය. මේ හේතුව නිසා වීදිය බණ්ඩාරට උඩරට රැඳී සිටීමේ අවස්තාව ද අහිමි විය. ඉන් පසුව වීදිය බණ්ඩාර තම වාසස්ථානය ලෙස තෝරාගත්තේ සත්කෝරළයේ කුරුණෑගලට නුදුරු මුදුකොණ්ඩපල ප්‍රදේශයයි. එහි පාලකයාව සිටි එදිරිමාන් සූරිය විසින් රණශූරයෙකු ලෙස ප්‍රසිද්ධියට පත්ව සිටි වීදිය බණ්ඩාර උණුසුම් ආකාරයෙන් පිළිගෙන ඔහුට ගම්වරයක් ද ලබාදී වාසය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීය. එලෙස විශේෂ පහසුකම් සපයන්නට හේතුවක් වන්නට ඇත්තේ රිබෙයිරෝගේ වාර්තාවේ දැක්වෙන ආකාරයට එදිරිමාන් සූරිය හෙවත් ඉරුගල් බණ්ඩාර, වීදිය බණ්ඩාරගේ ඥාතියකු වීමයි.[30] මෙලෙස ස්ථිර වාසස්ථානයක් නොමැතිව තැනින් තැනට යාමට සිදුවුවත් තම මූලික අරමුණ වූ පෘතුගීසීන් ලංකාවෙන් එළවා දැමීමත් සීතාවක පරාජය කිරීමත් යන අරමුණු අත්නොහළේය. එදිරිමාන් සූරියගේ සහය ඇතිව තම අරමුණු සඵලත්වය උදෙසා සේනා සංවිධානය කරමින් සිටින අතර තුර ඇතිවූ යම් ගැටලුවක් නිසා වීදිය බණ්ඩාරගේ සහායකයෙකු වූ වේලායුධ ආරච්චි අතින් එදිරිමාන් සූරිය ඝාතනය වේ.[31] මෙම ඝාතනය සිදු වී ඇත්තේ 1558 දී බව



මානියම්ගම් විහාරවාසී සිටිනාමළුවේ ධම්මපාල නම් යතිවරයෙකු විසින් ලියන ලද පුස්කොළ පොතක සඳහන් වේ.[32] මින්පසුව මුදුකොණ්ඩපල ප්‍රදේශයේ අධිපතියා බවට වීදිය බණ්ඩාර පත්වේ.[33] මෙම සිදුවීම් සමග යළිත් ක්‍රමිකව තම බලය ගොඩනගාගන්නා වීදිය බණ්ඩාර සවිමත් යුධ පෙරමුණක් ගොඩනැගීමට කටයුතු කරයි. මේ බව දැනගන්නා සීතාවක රාජසිංහ වීදිය බණ්ඩාරට එරෙහිව යුධ ප්‍රකාශ කරයි. සීතාවක රාජසිංහ සතුව තිබූ දැවැන්ත යුධ බලයට මුහුණ දීමට නොහැකි වූ වීදිය බණ්ඩාර තම හිතවත් සහායකයන් කිහිපදෙනෙක් සමගින් කුරුණෑගල අතහැර පලාගියේය.[34]

වීදිය බණ්ඩාර ජීවත්ව සිටිනතාක් සීතාවකට තර්ජනයක් බව වටහාගෙන සිටි සීතාවක රාජසිංහ ඔහු ඝාතනය කිරීම සඳහා පසුපස ලුහුබැඳ තිබේ. එහෙත් එම උත්සාහය සාර්ථක නොවන්නේ වීදිය බණ්ඩාර තම්මැන්නා අඩවිය හරහා පුත්තලමට පැන ගොස් එතැනින් නැවක නැග යාපනයට පැනගිය බැවිණි.[35] මෙම සිදුවීම පිළිබඳව තොරතුරු දක්වන 'සීතාවක රාජසිංහ රාජ්ජ කාලය' නැමැති පුස්කොළ පොත '' වීදියේ බණ්ඩාරත් විජේපාල අස්තාන ඇතුළු වූ රජදෙකට්ටුවත් බොහෝ සේනාවක් රාමක්කුලමේ හිඳිනා ප්‍රස්තාවට යාපාපටුන සේනාව එක්ව රජ දෙකට්ටුව හා සේනාව කොටන කල්හි අඹේපිටියේ මුදලියාරුන්නේ නයිදේ විජය කුමාරයා කියන බන්ඩිගෙයි රාළ දෙමළුන් හැටකට කොටා වීදියේ රජ්ජුරුවන්නේ සිරිපතුළ මුල වැටුනාහ''[36] යනුවෙන් දක්වා තිබේ. මෙමගින් යාපනයට ගිය වීදිය බණ්ඩාරට මුහුණ දෙන්නට සිදු වූ අවසාන සිදුවීම අනාවරණය කොට තිබුණත් යාපනයේදී වීදිය බණ්ඩාර සිදුකළ කාර්යයන් මොනවාදැයි අනාවරණය කොට නැත. එහෙත් පෘතුගීසි ලේඛන මගින් මෙම සිදුවීමට වඩා තොරතුරු ප්‍රමාණයක් අනාවණය කරගත හැකිව තිබේ. එම තොරතුරු වලට අනුව වීදිය බණ්ඩාර මෙසේ යාපනයට පැන යන්නේ හුදෙක්ම ජීවිතාරක්ෂාවේ අපේක්ෂාව පිණිසම පමණක් නොවන බව පැහැදිලි වේ. මෙම කාලවකවානුවේ යාපනයේ පාලකයා වූයේ 1519 දී එවකට එහි පාලකයාව සිටි පරරාජසේඛරන් ඝාතනය කොට බලය ලබාගත් සංකිලි නොහොත්

වෙකරාජසේකරන්ය. ඔහු ඒ වන විට ප්‍රතිකාල් විරෝධී සටනක් ආරම්භකොට තිබුණි. යාපනයට ගිය වීදිය බණ්ඩාරට යාපනයේ පැවති තත්ත්වය ස්වකීය අරමුණු සඳහා මනාව ගැලපුණි. එමනිසා සංකිලි රජු සමග පෘතුගීසීන් ලංකාවෙන් පලවා හැරීම සඳහා එකඟතාවක් ඇතිකරගැනීමට හැකිවිය. නමුත් එම එකඟතාව ඉදිරියට ගෙනයාමට නොහැකිවන්නේ පෘතුගීසීන්ට එරෙහිව සිදුකරන යුද්ධයට ප්‍රතිඥා දීම සඳහා දෙමළ සෙබළුන් දේවාලයකට කැඳවූ අවස්ථාවේ සිදු වූ අහඹු සිදුවීමක් හේතුවෙනි. පෘතුගීසි ලේඛක කූටෝගේ විස්තර දැක්වීම් වලට අනුව එම දේවාලයේ දී වීදිය බණ්ඩාර රැඳී සිටි ස්ථානය ආසන්නයේදී වෙඩිබෙහෙත් බඳුනක් පුපුරා යයි. එම පුපුරුවා හැරීම තමන් ඝාතනය කිරීමට දැරූ ප්‍රයත්යක් ලෙස සැලකූ වීදිය බණ්ඩාරගේ පිරිස, සංකිලි රජුට පහර දීමට ක්‍රියාකරයි. එම අවස්ථාවේ සිදු වූ සටනේ දී දෙමළ සෙබළුන් අතින් වීදිය බණ්ඩාර ඇතුළු පිරිස සමූල ඝාතනයට ලක්වේ. පූර්වයෙන් දක්වන ලද පුස්කොළ පොත් උධෘතයෙන් ද ඒ බව තහවුරු වේ. ඒ අනුව වීදිය බණ්ඩාරගේ මරණය සිදු වී ඇත්තේ 1559 හෝ 1560 යන වර්ෂයන් වලදී බව තහවුරු කළ හැකිය.

## වීදිය බණ්ඩාර විචාරාත්මකව හඳුනාගැනීම

දහසය වන සියවස මුල් කාර්තුවේ ලංකාව තුළ තිබූ අස්ථාවර රාජ්‍ය තත්ත්වය වීදිය බණ්ඩාර වැනි පුද්ගලයෙකු බිහිවීම සඳහා අවශ්‍ය වන පසුබිම නිර්මාණය කළ බව හඳුනාගත හැකිය. හත්වැනි බුවනෙකබාහු රජතුමා විසින් මාදම්පේ ප්‍රදේශයේ වාසය කළ වීදිය බණ්ඩාර කෝට්ටේ රාජධානියට කැඳවා එය ආරක්ෂා කිරීමේ වගකීම බාරදීමෙන් පෙනී යන්නේ ඔහුගේ සංග්‍රාම ශූරත්වය පිළිබඳව පූර්ව නිගමන තහවුරුව තිබූ බවයි. එකී පූර්ව නිගමනයන්ගේ සත්‍යතාවය වීදිය බණ්ඩාර විසින් ජයෝ බණ්ඩාර ඝාතනය කිරීම, 1546-1547 සීතාවක ආක්‍රමණය කිරීම, උඩරට වික්‍රමබාහු පරාජය කිරීම, එතකෝන් නිලමේ ඝාතනය කිරීම යන සිදුවීම් තුළින් මැනවින් තහවුරු කොට සිටී. එපමණක් නොව සමකාලීන පෘතුගීසී ලේඛන තුළිනුත් ගම්‍ය කරනු ලැබ ඇත්තේ වීදිය බණ්ඩාර යනු



තත්කාලීන ලංකාවේ සිටි විශිෂ්ටතම රණශූරයා බවයි. කිසිදු ලෙසකින් ප්‍රතිවාදීන් අගය නොකිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කළ දියෝගෝද කූටෝ හා ක්වේරෝස් වැනි පුද්ගලයන්ගේ ලේඛන මගින් උක්ත කාරණාව තහවුරු කර තිබීමෙන් තවදුරටත් වීදිය බණ්ඩාරගේ සංග්‍රාම ශූරත්වය අතිශයෝක්තියක් නොවන බව පැහැදිලිය.

විමසුම් ඇසින් වීදිය බණ්ඩාර දෙස බැලීමේදී පෙනීයන්නේ ලංකාවේ රජුවීමේ අපේක්ෂාවක් ඔහු තුළ තිබූ බවයි. බුවනෙකබාහු රජුට තමාගෙන් පසුව රාජ්‍යය බාරදීම සඳහා තමාගේ ලෙයින් උපන් පුතෙකු නොසිටි බැවින් ඒ සඳහා තෝරාගත්තේ වීදිය බණ්ඩාරගේ පුතෙකු වූ ධර්මපාලය. 1551 දී බුවනෙකබාහු රජු ඝාතනය කිරීමෙන් පසුව පෘතුගීසි පාලනය යටතේ සිටි ළාබාල ධර්මපාල කුමරා රැකඩ පාලකයෙකු වූ බැවින් කෝට්ටේ ජනයාගේ සැබෑ නියෝජිතයා බවට පත්වූයේ වීදිය බණ්ඩාරය. එම නිසා ඔහු අභිෂේක නොලත් රජෙකු වූ බව හඳුනාගත හැකිය. එම හේතුවෙන් පෘතුගීසීන් සහ සීතාවක රාජ්‍යය තමන්ගේ ප්‍රධාන හතුරා ලෙස සලකා ඇත්තේ වීදිය බණ්ඩාරය. උග්‍ර පෘතුගීසි විරෝධීන් දෙදෙනෙකු ලෙස සැලකෙන මායාදුන්නේ සහ පළමු රාජසිංහ පෘතුගීසීන් සමඟ සන්ධානගතව වීදිය බණ්ඩාරගේ පැළෑඳ බලකොටුවට පහරදී විනාශ කිරීමෙන් ඒ බව තහවුරුවේ. වීදිය බණ්ඩාරගේ ඉතිහාස කථාව තුළ හඳුනාගත හැකි ප්‍රධාන ලක්ෂණයක් වන්නේ ඔහු ගිය සෑම ස්ථානයකම පිරිස් බලය ගොඩනගාගැනීමට හැකිවීමයි. පැළෑඳ බලකොටුවක් තැනීමටත් එහි සිට දකුණු මුහුදු තීරයේ දැවැන්ත ආක්‍රමණයක් කිරීමටත් පමණක් නොව උඩරට, කුරුණෑගල, යාපනය ප්‍රදේශයන්හි සේනාබලමුළු ගැන්වීමටත් සමත්වීමෙන් උක්ත කාරණාව පැහැදිලිවේ. මේ කටයුතු සඳහා බොහෝ සෙයින්ම වීදිය බණ්ඩාර රණශූරයෙකු ලෙස ලබාගෙන තිබූ ජනප්‍රියත්වය හේතුවී තිබේ.

ලාංකේය යටත් විජිත ඉතිහාසය තුළ අපරදිග ජාතීන් විසින් පතුරුවනු ලැබූ ආගමික ක්‍රියාවලියට නිර්දය ලෙස පහරදීම ඇරඹූ ප්‍රථම ලාංකියා වීදිය බණ්ඩාරයි. ඒ බව 1551 දී පැමිණි අල්පොන්සෝද නොරඤ්ඤෝ කෝට්ටේ කොල්ලකා ගිය

පසු වීදිය බණ්ඩාර කෝට්ටෙන් පෘතුගීසින් පලවාහැර කෝට්ටේ රාජ්‍යයේ ක්‍රිස්තියානි ආගම ඇදහීමේ තහනමක් පැනවීමෙන් හා පැළෑඳ බලකොටුවේ සිටින සමයේ පානදුර, කලුතර, මග්ගොන, බේරුවල, ගාල්ල හා වැලිගම යන ප්‍රදේශයන්හි පිහිටි සියලුම පල්ලි විනාශ කිරීමෙන් ද තහවුරුවේ.

වීදිය බණ්ඩාර චරිතය තුළ හඳුනාගත හැකි තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ මිය යන මොහොත දක්වාම ස්වකීය අරමුණ ජයගැනීම සඳහා වෙහෙසීමේ ගුණාංගයයි. අනාවරණිත ලාංකේය ඉතිහාසය තුළ මේසා විශාල ප්‍රදේශයක සේනා සංවිධනය කළ වීදිය බණ්ඩාර තරම් වෙනත් පුද්ගලයෙකු හමු නොවේ. වත්මන් පළාත් බෙදීම් අනුව ගතහොත් බටහිර, වයඹ, මධ්‍යම සහ උතුර යන ප්‍රදේශයන්හි සේනා සංවිධානය කොට තිබේ. එම ප්‍රදේශයන්ට අමතරව සබරගමු පළාත හා දකුණු පළාත යන පළාත් දෙකට ආක්‍රමණ එල්ල කිරීමට සමත්ව තිබේ. ඒ අනුව සලකා බලන විට පෙනී යන්නේ වීදිය බණ්ඩාර ලංකාවම ආවරණය වන ආකාරයට ස්වකීය ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කොට ඇතිබවයි. මේ සියලු ක්‍රියාකාරකම් තුළ වීදිය බණ්ඩාරගේ අරමුණ වී ඇත්තේ පෘතුගීසීන් ලංකාවෙන් කෙසේ හෝ පලවා හැරීමයි.

මෙකී සියලු කාරණාවන්ගෙන් පැහැදිලිවන්නේ ඉතිහාසය සමාජගත විමේදී වීදිය බණ්ඩාර නිවැරදිව හඳුනාගැනීමක් සිදුකොට නොමැති බවයි. එම නිසා තත්කාලීන සමාජ දේහයේ උද්ගත තත්ත්වයන්ට සංවේදී වෙමින් ඒවාට සක්‍රිය මැදිහත් වීම් සිදු කළ වීදිය බණ්ඩාර වැනි පුද්ගලයන්ට ඔවුන්ගේ සැබෑ වටනාකම සැබෑ ලෙසම ලබාදීම ඉතිහාස අධ්‍යයයේ පරම යුතුකම විය යුතුය.

## ආන්තික සටහන්

1. ටිකිරි බණ්ඩා හේරත් අභයසිංහ, පරංගි කෝට්ටේ ( ප්‍රකාශන ස්ථානය සඳහන් නොවේ: ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්, 1966), 2. ; එම්. යූ. ද සිල්වා, "කෝට්ටේ හා සීතාවක රාජධානි", ශ්‍රී ලාංකේය ඉතිහාසය-111, (සංස්.) ඩබ්ලිව්. එම්. කේ. විජේතුංග, (කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 2012), 53.



2. අලකේශ්වර යුද්ධ, (සංස්.) ඒ. වී. සුරවීර (කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ, 1965), 33.
3. Queyroz Fernoa De, **The temporal and spiritual Conquest of Ceylon**, Trans. father S.G. Perera (Madras: 1992), 220-221.
4. **Journal of the Royal Asiatic society** (J.R.A.S), vol.xx ,No-60, 1908,100.
5. Queyroz, 333.
6. ශ්‍රී ලාංකේය ඉතිහාසය-111, 66.
7. රාජාවලිය, (සංස්.) ඒ. වී. සුරවීර (කොළඹ: අධ්‍යපන දෙපාර්තමේන්තුව, 1997), 73.
8. Queyroz, 228.
9. පද්මසිරි කන්නංගර, "වීදිය බණ්ඩාරගේ පැළෑඳ බලකොටුව හා පස්දුන් කෝරළ", කලුතර දිසාවරුණ, (සංස්.) කේ. ටී. ජී. සුමතිපාල සහ ඉමන්කා ජයවීර (සෙත්සිරිපාය: සංස්කෘතික අංශය-කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, 2013), 70-71.
10. රාජාවලිය, 229.
11. අලකේශ්වර යුද්ධය, 38.
12. රිස්මන් අමරසිංහ, ඓතිහාසික සීතාවක, (කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1990), 38.
13. රාජාවලිය, 11.
14. අලකේශ්වර යුද්ධය, 37.
15. රාජාවලිය, 94-95.
16. රිස්මන් අමරසිංහ, ඓතිහාසික සීතාවක, 41.
17. රිස්මන් අමරසිංහ, ඓතිහාසික සීතාවක, 41.
18. රාජාවලිය, 235.
19. ශ්‍රී ලාංකේය ඉතිහාසය-111, 80.
20. එම, 71.
21. Queyroz, 333.
22. P.E. Piers, **Ceylon the portugese Era – vol.1**, (Colomb: 1992), 126-127.
23. Queroz, 333.
24. රාජාවලිය, 231.
25. අලකේශ්වර යුද්ධය, 38.

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය 23 JUL 2019 පුස්තකාලය

26. **Journal of the Royal Asiatic society**, 161.
27. P.E. Piers, 132-133.
28. ශ්‍රී ලාංකේය ඉතිහාසය-111, 73.
29. Queroz, 318.
30. ජෝ. ආ. ඕ. රිබෙයිරෝ, රිබයිරෝ ලංකා ඉතහාසය, (පරි.) ටී.කේ. රුබේරු (මරදානඃ එස්. ගොඩගේ සහෝදරයෝ, 2003), 35.
31. රාජාවලිය, 235.
32. රිසිමන් අමරසිංහ, සීතාවක රාජධානියේ උන්නතියේ ද අවනතියේ ද සමහර අංශ පිළිබඳ විමර්ශනයක් ( සීදූවඃ කතෘ ප්‍රකාශන, 1990), 83.
33. රංගන කුරුවිට, කුරුණෑගල විස්තරය (කොළඹඃ සූරිය ප්‍රකාශකයෝ, 2015), 167.
34. අලකේශ්වර යුද්ධය, 41. ; රාජාවලිය, 234.
35. එම, 40.
36. රිස්මන් අමරසිංහ, ඓතිහාසික සීතාවක, 41.